# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 16 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1982 මාර්තු මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : ශත 35 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1982 අංක 16 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 25 වන දින.]

එල්. ඩී.—ඕ. 2/81.

**1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1982 අංක 16 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1972 අංක 10 දරන පනතෙහි 13අ වන අලුත් වගන්තිය අන්තර්ගත කිරීම.

2. 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර දීමේ පනතෙහි 13 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ පනතෙහි 13අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"සේවානියුක්තයාගේ හෝ සේවකයාගේ වැරදි සඳහා නැව් නියෝජිතයා වගකිව යුතු බව.

13අ. යම් නැව් නියෝජිතයකුගේ සේවානියුක්තයකු හෝ සේවකයකු විසින් ඒ නියෝජිතයාගේ ව්‍යාපාරයෙහි නියුක්ත වී සිටින අතර මේ පනත යටතේ යම් වරදක් කරනු ලැබූ විට, ඒ වරද කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව බව ඒ නැව් නියෝජිතයා විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරද ඒ නැව් නියෝජිතයා විසින් කරන ලද්දක් සේ සලකනු ලැබිය යුතු ය."

ජ 61745—11,975 (82/02)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.